මට හා මෙලොවට කිසිවක් නැත. මා මෙලොවෙහි ගසක් යට හෙවණ සොයා, පසුව විවේකය ලබා, එය අත්හැර දමා යන මගියෙකු මෙන් මිස නැත

අබ්දුල්ලාහ් ඉබ්නු මස්ඌද් (රළියල්ලාහු අන්හු) තුමා විසින් වාර්තා කරන ලදී: අල්ලාහ්ගේ දූතයාණෝ (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) පැදුරක නිදා ගෙන නැගිට්ටහ. එතුමාණන්ගේ පිටෙහි එහි සළකුණු පිහිටා තිබිණ. එවිට අපි: "අහෝ අල්ලාහ්ගේ
දූතයාණනි, අපි ඔබ වෙනුවෙන් මෙට්ටයක් සූදානම් කරන්නදැ?"යි විමසා සිටියෙමු. එවිට එතුමාණෝ: "මට හා මෙලොවට කිසිවක් නැත. මා මෙලොවෙහි ගසක් යට හෙවණ සොයා, පසුව
විවේකය ලබා, එය අත්හැර දමා යන මගියෙකු මෙන් මිස නැත." [صحيح] [رواه الترمذي وابن ماجه]

අබ්දුල්ලාහ් ඉබ්නු මස්ඌද් (රළියල්ලාහු අන්හු) තුමා මෙසේ මෙනෙහි කර සිටියේය. අල්ලාහ්ගේ දූතයාණන් (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) ඇතැම් පැල වලින් වියන ලද කුඩා පැදුරක නිදා ගෙන සිට පසුව නැගිටුණහ. එතුමාණන්ගේ පිටෙහි පැදුරෙහි සළකුණු පිහිටා තිබිණ. එවිට අපි මෙසේ පැවසුවෙමු.: "අහෝ අල්ලාහ්ගේ දූතයාණනි! අපි ඔබ වෙනුවෙන් සිනිදු මෙට්ටයක් සූදානම් කළේ නම්, එම රළු පැදුරේ ඔබ හාන්සි වීමට වඩා යහපත් වනු ඇත." එවිට සල්ලල්ලාහු අලයිහි වසල්ලම් තුමාණෝ මෙසේ පැවසූහ. මෙලොවට මා ප්රිය කරන තරමට මෙලොව සමග කිසිදු ඇල්මක් හෝ කැමැත්තක් හෝ මට නැත. මා හා මෙලොවෙහි මා ජීවත් වීමේ උපමාව මෙලොවෙහි ගසක් යට හෙවණ සොයා, පසුව විවේකය ලබා, එය අත්හැර දමා යන මගියෙකු මෙන් මිස නැත."

https://www.sunnah.global/hadeeth/si/show/65814